ප්‍රශංසනීය පළාත් රාජ්‍ය සේවයක්
உன்னதமானமாகாணஅரசாங்கசேவை
ADMIREABLE PROVINCIAL PUBLIC SERVICE
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - උතුරු මැද පළාත
மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - வடமத்தியமாகாணம்
PROVINCIAL PUBLIC SERVICE COMMISSION – NORTH CENTRAL PROVINCE
මෛත්‍රීපාල සේනානායක මාවත අනුරාධපුර
மைத்திரீபால சேனாநாயக்க மாவத்தை, அநுராதபுரம்
Web Site:www.psc.nc.gov.lk Maithripala Senanayake Mawatha, Anuradhapura E-mail:pscncp@gmail.com

# උතුරු මැද පළාතේ පළාත් සභා පාසල් වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1(අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම -2023 (II අදියර)

## සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම

උක්ත කරුණට අදාළව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වන ලද ලිඛිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත විභාග නිවේදනයේ සඳහන් පරිදි ලිඛිත විභාගයේ එක් එක් විෂයට ලකුණු 40ට වඩා ලබාගෙන විභාගය සමත්වී ඇති අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව, එක් එක් විෂය සඳහා පැවති පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම පරීක්ෂණය සඳහා කැඳවා ඇත. **( ඇමුණුම 01)**

උක්ත සම්මුඛ පරීක්ෂණයන් සහ ප්‍රායෝගික පරීක්ෂණයන් 2024.04.02, 03 හා 04 යන දිනවල උතුරු මැද පළාත් සභා ශ්‍රවනාගාරයේ ( පස්වන මහළ) දී පැවැත්වීමට කටයුතු සූදානම්කර ඇත.ඒ අනුව එදිනට පහත සඳහන් සහතික හා ලිපි ලේඛනවල මුල් පිටපත් සහ ඡායා පිටපත් රැගෙන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ලෙස ඔබට මෙයින් දන්වමි.

මෙහි සඳහන් නොවන සහතික හෝ ඡායා පිටපත් ඉදිරිපත් නොකිරීමට වග බලා ගතයුතු අතර, එම සහතිකයන්හි ඡායා පිටපත් **ඔබ විසින් සත්‍ය පිටපත් බවට සහතික කර,** එම සහතික කාඩ්බෝඩ් ලිපිගොනුවක (file) පහත අනු පිළිවෙල අනුව සකස් කර රැගෙනආ යුතු අතර, එම ලිපි ගොනුවේ මුහුණතෙහි වම් පස ඉහල කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

- ඔබගේ කැඳවීම් අංකය: (වෙබ් අඩවියේ පළ කර ඇති ඔබේ නමට අදාළ මණ්ඩල අංකය සහ කැඳවීම් අංකය),
- ඔබගේ විභාග අංකය:
- ඔබගේ ජාතික හැඳුනුම්පතට අනුව මුලකුරු සමඟ නම: ( සිංහලෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් වෙන වෙනම සඳහන් කළ යුතුය)
- ජාතික හැඳුනුම්පත් අංකය:
- දුරකථන අංකය:

01.ජාතික හැඳුනුම්පත හා උප්පැන්න සහතිකය ( නමේ වෙනසක් ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.)

02. අ.පො.ස සාපෙළ සහ උ.පෙළ සහතික වල මුල් පිටපත්

- විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රතිඵල සහතිකයක් විය යුතුයි.

03. උපාධි සහතික/ඩිප්ලෝමා හා විස්තරාත්මක උපාධි සහතික මුල් පිටපත් (degree Certificate and Detail Certificate)

- රජයේ විශ්ව විද්‍යාල හැර පෞද්ගලික,/ විදේශ විශ්ව විද්‍යාල හෝ උපාධි පිරිනමන ආයතන වෙතින් ලබාගත් උපාධියක් නම් අදාළ ආයතනය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි සහතිකය/ අනුමැතිය ලත් ලේඛනය ඉදිරිපත් කළ යුතුය.

04. ඔබගේ පදිංචිය තහවුරු වන පරිදි ග්‍රාම නිලධාරී සහතිකය (DS 04) ඉදිරිපත් කළ යුතුය. එහි ඔබේ පදිංචිය කවදා සිට ද යන වග සඳහන් විය යුතුය.

එහිදී ඔබ අයදුම්කරනු ලබන්නේ කලත්‍රයාගේ පදිංචිය මත නම් කලත්‍රයාගේ පදිංචිය තහවුරු වන ග්‍රාම නිලධාරී සහතිකය සමඟ විවාහ සහතික ඉදිරිපත් කළ යුතුවේ. ( ඔබගේ ස්ථිර පදිංචිය උතුරු මැද පළාතට නීත්‍යානුකූලව මාරු කර ඇත්නම් කලත්‍රයාගේ පදිංචිය තහවුරු වන ග්‍රාම නිලධාරී සහතිකය සමඟ ඔබගේ පදිංචිය සනාථවන ග්‍රාම නිලධාරී සහතිකයද ඉදිරිපත් කළ යුතුය.) පදිංචිය කවදා සිටද යන වග සඳහන් විය යුතුය.

**සැ.යු.** **<u>එමෙන්ම ඉහත දක්වා ඇති සියලුම ලේඛන සුදුසුකම් පරික්ෂා කරන දිනයේදීම ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛන කිසිවක් භාරගනු නොලැබේ.</u>**

05 .ඔබ විසින් අයදුම් කරන ලද විෂයකට අදාල ව පහතින් දක්වාඇති පරිදි මිනිත්තු 5 කට නොවැඩි කාලයක් තුළ තෝරාගත් මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. ඔබ විසින් සිදු කරනු ලබන ඉදිරිපත් කිරීම සඳහා Microsoft Power point Presentations කිසි සේත් යොදාගත නොහැකි අතර. පන්ති කාමර තුළ සිදු කරන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය අනුව, ඉගෙනුම් උපකරණ භාවිත කරමින් ඉදිරිපත් කිරීම සිදු කළ යුතුවේ.

06. ඉංග්‍රීසි විෂය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් ද ඉංග්‍රීසි මාධ්‍ය පුරප්පාඩු සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් තම ඉදිරිපත් කිරීම ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදු කළ යුතුය.

දෙවන බස දෙමළ විෂය සඳහා අයදුම්කර ඇති සිංහල මාධ්‍ය අයදුම්කරුවන් තම ඉදිරිපත් කිරීම දෙමළ මාධ්‍යයෙන් සිදු කළ යුතුය.

07. සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඔබට නියමිත වේලාවට මිනිත්තු 15කට පෙර පළාත් සභා ශ්‍රවනාගාරය වෙත පැමිණීම අනිවාර්යය වේ.

08. පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයකට ආසන්න අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයන් සඳහා කැඳවා ඇති බැවින් මෙම කැඳවීම , පත්වීම් ලබාදීම සඳහා සුදුසුකමක් ලෙස කිසිසේත් නොසැළකිය යුතුය.

ජී.කේ.එස්.චන්ද්‍රලතා,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2024.03.25

## ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය

- ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි 5කට නොවැඩි කාලයත් ලබා දෙනු ලබන අතර නිර්ණායකයන්හි අරමුණු පහත පරිදිවේ.

| | | |
|---|---|---|
| i | අරමුණ හා ප්‍රවිශ්ඨ වීම | සාර්ථකව පාඩමේ අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ඨ වීමේ හැකියාව ඇගයීම. |
| ii | පෞරුෂය හා හඩ පාලනය | ගුරුවරයෙකු ලෙස මනා යෞරුෂයකින් යුතුවීම හා ඉගැන්වීමේදී මනා ලෙස හඩ පාලනය කිරීමේ හැකියාව |
| iii | සන්නිවේදනයේ පැහැදිලි බව | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම. |
| iv | කාල කළමනාකරණය | ලබාදෙනු ලබන කාලසීමාව තුළ අරමුණු කෙරෙහි ළඟාවීමේ කුසලතාවය ඇගයීම. |
| v | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | අරමුණු කෙරෙහි ළඟාවීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිත කිරීමේ හැකියාව ඇගයීම. |

මේ සඳහා පහත පරිදි ලකුණු හිමිවේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| i | අරමුණ හා ප්‍රවිශ්ඨ වීම | 05 | 02 |
| ii | පෞරුෂය හා හඩ පාලනය | 05 | 02 |
| iii | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| iv | කාල කළමනාකරණය | 05 | 02 |
| v | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 | 02 |
| | **මුළු ලකුණු ප්‍රමාණය** | **25** | **10** |